# වැඩි ලාබ ලැබෙන තාරාවුන් පාලනය

පශු වෛද්‍ය නිලධාරී

**එස්. පී. ගුණරත්න**

විසිනි

ශ්‍රී ලංකාවේ කුකුලන් ඇති කිරීමේ කර්මාන්තය හා සසඳා බලන විට තාරාවුන් ඇති කිරීම සාපේක්ෂ වශයෙන් කුඩා කර්මාන්තයකි. මෑත අවුඇදු කීපය තුළ කුකුල් පාලනයේ සීඝ්‍ර වර්ධනයක් පෙනෙන්නට තිබූ නමුත් ඒ හා සමාන දියුණුවක් තාරාවුන් නිෂ්පාදනයේ සිදු නොවීය. තාරාවුන් ඇති කිරීම පිළිබඳව ගොවීන්ගේ දැනුම මදකමත්, එම නිෂ්පාදන ජනතාව අතර ජනප්‍රිය නොවීමත් සහ මෙම කර්මාන්තය පිළිබඳව ව්‍යාප්ති කටයුතු වල අඩුපාඩුවත් මේ සඳහා ප්‍රධාන හේතූන් වශයෙන් දැක්විය හැක, ඒ කෙසේ වෙතත් කුකුලන් ඇති කිරීමේ දී ලැබෙන ප්‍රයෝජන වලට වඩා, තාරාවුන් ඇති කිරීමෙන් ලැබෙන සමහර විශේෂ ප්‍රයෝජන, දැනට ප්‍රමුඛතාවයක් දී ඇති කුඩා පරිමාණයේ සමුදන ගොවිපල සංකල්පයක් අනුව සලකන විට නොසලකා හැරිය හැකි නොවේ.

**තාරාවුන් ඇති කිරීමේ වාසි**

පරිසර පීඩනයන්ට ඔරොත්තු දීමේ වැඩි ශක්තියක් ඇති තාරාවුන් කුකුලන් මෙන් පහසුවෙන් ලෙඩ වලට භාජනය නොවේ. අපේ රටේ දේශගුණික තත්ත්වයන් යටතේ පැටවුන් සති දෙකක් හෝ තුනේදී පමණ රැලෙන් වෙන් කළ හැක. මරණ සංඛ්‍යාව සාමාන්‍යයෙන් ඉතා අඩු ය. තාරාවුන්ට සාපේක්ෂ වශයෙන් සරල සහ ලාබ දයක නිවාස සෑහෙන අතර ඔවුනට අයහපත් තත්ත්වයන්ට, ඔරොත්තු දීමේ වැඩි හැකියාවක් ඇත. බිත්තර දමන තාරාවියක් අවුරුද්දක දී කිකිළියකට වඩා බිත්තර 30ටත් 50ටත් අතර වැඩි ප්‍රමාණයක් ලබා දෙන අතර ඔවුන්ගේ බිත්තර ප්‍රමාණයෙන්ද විශාලය. මස් සඳහා ඇති කරන තාරාවුන්, මස් සඳහා ඇති කරන කුකුලන්ගේ වර්ධනය අභිබවයි. එහෙත්, මෙහිදී සැලකිය යුතු කරුණක් වන්නේ මේ අවස්ථා දෙකෙහිදීම ආහාර පරිවර්තන කාර්යක්ෂමතාව කුකුලන් ගේ තරම් සතුටුදයක නොවීමයි.

උදහරණයක් වශයෙන් : බිත්තර දමන තාරාවියකට බිත්තර දුසිමක් නිෂපාදනයට ආහාර කි.ග්‍රෑ. 3.1 ක් පමණ අවශ්‍ය වන අතර කිකිළියකට මේ සඳහා අවශ්‍ය වන්නේ කි.ග්‍රෑ. 2.0 පමණි. එලෙසම මස් වර්ගයේ තාරාවකුගේ ආහාර පරිවර්තන කාර්යක්ෂම 'තාව 3.8:1 ක් පමණ වන අතර මස් වර්ගයේ කුකුලකුගේ එය 2.5:1 පමණ වේ. ආහාර පරිවර්තන කාර්යයක්ෂමතාව එසේ අඩු වුවත් , මෙම සතුන්ගේ ආහාරයට ඉවත ලද ආහාර ද්‍රව්‍ය, ගොලු බෙල්ලන්, පනුවන් කෘමීන්, ගුණයෙන් අඩු පෝටීන් හීන ආහාර, සහ නොයෙකුත් පලා වර්ග අඩංගු කළ හැකි බැවින්, ඒ මාර්ගයෙන් ආහාර වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගත හැක.

**තාරාවුන් වර්ග:**

(1) මස් පිණිස ඇති කිරීමට සුදුසු තාරා වර්ග

(අ) මස්කොවි (Muscovy) : දකුණු ඇමෙරිකාව මුල් කරගත් වර්ගයක් වන අතර (මලාඩ් (Mullard) නැතහොත් වල් තාරාවා ( wild duck ) ගෙන් ඇති වූ අනෙක් තාරා වර්ග වලට සමානකම් නොදක්වයි. මස්කොවි තාරාවන් වර්ග හතක් පමණ සිටින නමුත් ඉන් වඩාත් ජනප්‍රිය සුදු වර්ගයයි. මොවුන්ගේ ශරීරය දිගින් සහ පළලින් යුක්ත වන අතර මුහුණ පිහාටු වලින් තොර දීප්තිමත් රතු පැහැයක් ගනී. හොඳින් පියාඹීමට හා අහුලා කෑමට හැකියාවක් ඇති නමුත් පුරුද්දක් වශයෙන් ඉබාගාතේ නොයයි. දිග තියුණු නිය ඇති නිසා ඔවුන් ප්‍රවේශමෙන් ඇල්ලිය යුතුයි.

ගැහැණු සතා පිරිමි සතාට වඩා තරමක් කුඩාය. වැඩුණු පිරිමි සතෙකු රාත්තල් 10ත් 14ත් අතර වන අතර ගැහැණු සතෙකු රාත්තල් 5ත් 7ත් අතර වේ.

මස්කොවි පිරිමි සතාගේ පෙදයෙහි කැරකුණු පිහාටු නැති අතර, ගැහැණුසතා හඬ නොනගයි. වෙනත් තාරා වර්ග හා දෙමුහුන් කල විට ලැබෙන පැටවුන් වඳ බවක් දක්වයි. මස්කොවි තාරාවියන් බිත්තර දැමීම අතින් දුර්වලය.

මස් කොච් වර්ගය පාරිසරික පීඩාවන්ට හොඳින් ඔරොත්තු දෙන බැවින් පැටවුන් ඇති කිරීම පහසුය. ගැහැණු තාරාවියන් සති 14ක දී රාත්තල් 5ත් $5\frac{1}{4}$ත් පමණ වූ විට වෙළඳ පොළට යවන අතර පිරිමි සතුන් සති 16 දී රාත්තල් 09ක් වූ විට වෙළඳ පොළට යැවීමට සුදුසු ය. මස්කොච් බිත්තර හා පැටවුන් රැකීමට දක්ෂය.

(ආ) පිකින් (Pekin) : චීනය මුල්කර ගත් වර්ගයකි. ශරීරය පළලින් යුක්ත වන අතර සෘජු ගමන් ලීලාවක් දක්වයි. පිහාටු ලා කහ පාටට හුරු සුදු පාටින් යුක්ත වන අතර හොට සහ කකුල් දීප්තිමත් රතු මිශ්‍ර කහ වර්ණයෙන් යුක්තය. කම්මුල් ඉදිරියට නෙරා ඇති ඔවුන්ගේ ඇස්, ඝනව වැඩුනු ඇස් බැමි වලින් මදක් වැසෙයි. අවුරුද්දකට බිත්තර 120ත් 140 ත් අතර ප්‍රමාණයක් දමයි. ඔවුන් රැකීමෙන් කාලය ගත කරන්නේ කලාතුරකිනි.

පිකින් වහා කලබල වන සුළු සතෙකු නිසා ප්‍රවේශමෙන් ඇල්லිය යුතුය. ඔවුන් කීකරු සතුන් වන අතර වැඩි උස නොවූ වැටක් තුළ පහසුවෙන් රඳවා ගත හැකිය.

වැඩුනු පිරිමි සතෙකු රාත්තල් 9 ක් පමණ වන අතර ගැහැණු සතෙකු රාත්තල් 8ක් පමණ වේ. සාමාන්‍යයෙන් සති 9 යේදී රාත්තල් $5\frac{1}{4}$ පමණ වූ විට වෙළඳ පොළට යැවීමට සුදුසුය.

(2) බිත්තර පිණිස ඇති කරන තාරා වර්ග

(අ) කාකි කැම්ප්බෙල් (Khaki Campbell) : එංගලන්තයේ ග්ලොස්ටර්ෂයර් ප්‍රදේශයේ කැම්ප්බෙල් නැමැති මහත්මියක විසින් බෝ කරන ලද වර්ගයකි. කාකි කැම්ප්බෙල් තාරාවියන් ඉතා හොඳින් බිජු ලන්නෝ ය. සාමාන්‍යයෙන් වසරකට බිත්තර 300 ඉක්මවයි.

වැඩිහිටි කාකි කැම්ප්බෙල් තාරාවෙකු රාත්තල් 04 ක් 05ක් පමණ, අඩු බරකින් යුත් කුඩා සතෙකි. මාස $4\frac{1}{2}$ පමණ වයසේදී බිත්තර දැමීම ආරම්භ කරයි.

(ආ) ඉන්ඩියන් රනර් (Indian Runrer) : දකුණු ආසියා ප්‍රදේශයේ දියුණු කළ වර්ගයකි. කුඩා සතුන් වූ මේ වර්ගය ඔවුන්ගේ පැහැදිලි සෘජු ඉරියව් සිහින් දිග බෙල්ල සහ කෙට්ටු වූ මනා පෙනුම, නිසා පහසුවෙන් වෙන්කර හඳුනාගත හැක.

ද්විකාර්ය තාරා වර්ග

(අ) වැලිව් (Value) : වසරකට බිත්තර 275 පමණ දමයි. මාස $5\frac{1}{2}$ පමණ වන විට බිත්තර දැමීම ආරම්භ කරයි.

(ආ) බෆ් ඕරිපින්ටන් (Bupt orpinaton) : මධ්‍යම ප්‍රමාණයේ සතෙකි. එංගලන්තයේ කෙන්ට් ප්‍රදේශයේ ඕර්පින්ටන් හිදී බෝ කරන ලද්දකි.

බිත්තර රක්කවීමේ කාලය : මස්කොච් වර්ගයේ දින 35 ක් වේ. අනෙක් වර්ග වල දවස් 28 කි.

පැටවුන් රැක්කවීම

තාරාවුන්ට දැඩි පරිසර පීඩාවන්ට ඔරොත්තු දීමේ හැකියාවක් ඇති අතර ඔවුන් රැක බලා ගැනීම පහසුය. මුල් දවස් කීපය තුළ සුදුසු ආහාර, පිරිසිදු ජලය, උණුසුම සැපයීම අවශ්‍ය වන අතර තවත් වැදගත් කරුණක් නම් පැටවූ රක්කනයේ වියලි බව සහ පිරිසිදු බවයි. තාරාවුන්ගේ පිහාටු හොඳින් වැවෙන තුරු ශීත සුළඟින් සහ තද වැසි වලින් ආරක්ෂා කිරීම අත්‍යවශ්‍යය.

(අ) පැටවුන් රැක්කවීමේ ස්වභාවිකය ක්‍රමය.— තාරා පැටුව්වුන් සුළු සංඛ්‍යාවක් සාර්ථක ලෙස කාරාවියක මාර්ගයෙන් රැක්කවිය හැක. හොඳට රකින තාරාවියකට 15 ත් 20ත් අතර පැටවුන් ප්‍රමාණයක් රැකිය හැක්කේ ඔවුන්ට ඉතා සමීප රැකීමක් අවශ්‍ය නොවන බැවිනි.

(ආ) පැටවුන් රැකවීමේ කෘතීම ක්‍රමය.—විශේෂ උපකරණ අවශ්‍ය නොවේ. කුකුලන් සඳහා යොද ගන්නා ඕනෑම පැටවූ රක්කනයක් මේ සඳහා යොදගත හැක. එහෙත් මෙහි දී නිර්දේශ කර ඇති අවකාශ ධාරිතාව කුකුලන්ගේ මෙන් දෙගුණයකි. සති දෙකක් හෝ තුනක් ඇතුළත කාලයේදී පැටවුන් රක්කනයෙන් ඉවත් කළ හැක.

### රැක බලා ගැනීම

රක්කනයෙන් ඉවත් කල පසු පැටවුන් කොටු තුළ හෝ නිදල්ලේ ඇතිකල හැක. තාරාවුන්ට සරල නිවාස සෑහේ. නිවාස ඇතුලත වියලි බවෙන් සහ හොඳ වාතාශ්‍රයෙන් යුක්ත විය යුතු අතරතද සුළඟින් ආරාක්ෂා විය යුතුයි.

කොටු තුල ඇති කරන විට බර වර්ගයේ තාරා වෙකුට වර්ග අඩි 6 සිට 7 දක්වාත්, සැහැල්ලු වර්ග වලට අඩි 5 සිට 6 දක්වාත් ඉඩ ප්‍රමාණයත් අවශ්‍යය. කොටු හා ආවාරණය කරන ලද එළිමහන් හෝ ඇති කරන අවසස්ථා වලදී වර්ග අඩි 3½ සිට 4 අතර ඉඩ ප්‍රමාණයක් කොටුව තුළත් අවම වශයෙන් වර්ග අඩි 20 ක ඉඩ ප්‍රමාණයක් එළිමහන් ආවරණය තුළත් ඉඩ තිබීම අවශ්‍යය. අඟල් 24 ත් 30 ක් පමණ උස් වැටක් යෙදීමෙන් මෙම ක්‍රමයේදී සතුන් ඔවුන්ගේ කොටු වලට සීමා කළ හැක.

සමස්තයක් වශයෙන් ගත් කල කුඩා පෙට්ටි ලොකු පට්ටි වලට වඩා සාර්ථක බවක් පෙන්වයි. තාරාවුනට ජල පොකුණු අත්‍යවශ්‍ය දෙයක් නොවේ. එහෙත් සැමවිටම ඔවුන්ගේ හොට ගිල්වා ගැනීමට තරම් සෑහෙන ජල ප්‍රමාණයක් තිබීම වැදගත්ය. ඒ කෙසේ වෙතත් තාරාවුන් පිහිණීමට දැඩි කැමැත්තක් දක්වන අතර ජලයෙහි දී ඔවුන් වඩා පහසුවෙන් සංසර්ගයෙහි යෙදෙති. තවද, පිහිණීමට ජලය ඇති විට ඔවුන්ගේ බිත්තර වල සශ්‍රීක තාවයද වැඩි බවක් පෙන්වයි.

තාරාවුන් බියගුලු සතුන් වන අතර පහසුවෙන් කලබල වේ. දින චරියාවේ හෝ කෑමෙහි වෙනස් කිරීමක් මගින් ඔවුන්ගේ බිත්තර දැමීම වුවද නතර විය හැක.

තාරාවුන් බොහෝ විට හිමිදිරි උදෑසන හිරු නැගීමට පෙර බිත්තර දමයි. එබැවින් ඔවුන් උදේ 8.00 හෝ 9.00 පමණ වන විට එළියට යැවිය හැක. එහෙත් සමහර විට සතුන්ගේ බිත්තර මූරය අවසන් වන කාලයේදී සවස් භාගයේ දී බිත්තර කීපයක් දමනු ලබයි. බිත්තර දැමීම සඳහා බිත්තියට සවිකල බිම මට්ටමෙහි වූ නොගැඹුරු බිත්තර පෙට්ටි සැපයීම සුදුසු නමුත් තාරාවුන් බොහෝ විට බිත්තර බිම දමයි.

### පෝෂණය

කොටු හා ආවරණය කරන ලද එළිමහනේ ඇති කිරීමේ දී සාන්ද්‍ර ආහාර ඉතා සුළු ප්‍රමාණයක් අවශ්‍ය වන අතර ගේ දෙර අපෙතේ යන ද්‍රව්‍යය ද සපයා නිදල්ලේ අහුලා කෑමට ද මුදා හැරිය හැක.

සාන්ද්‍ර ආහාර සැපයීමේ දී දෙනු ලබන ආහාර මිශ්‍රණ බොහෝ විට කුකුලන්ගේ ආහාර මිශ්‍රණ වලට සමානය. මූලික වශයෙන් පැටවුන් වැඩෙන සතුන් බිත්තර දමන කිකිළියන් සහ බෝ කිරීම සඳහා ඇති කරන සතුන්ට ආදී වශයෙන් වෙනත් ආහාර මිශ්‍රණ හතරක් දීම අවශ්‍යය.

ආහාර වියලි, තෙත් හෝ කැට වශයෙන් දිය හැක. කෑම නාස්තිය අධික නිසා ආහාර වියලි වශයෙන් දීම කරන්නේ මද වශයෙනි. පලා වර්ග නිතරම සැපයිය හැක. සැම අවස්ථාවකම සිප්පි කටු හා සන කැට දීම කළ යුතුයි.

දිවා රාත්‍රි දෙකෙහිදීම සතුන්ගේ අවශ්‍යතා සඳහා ජලය සැපයිය යුතුය.

තාරාපැටවුන්ට මුලින් සපයන ආහාරය සති දෙකක් සපයා දෙ ලැබේ. එහි 20% පමණ ප්‍රෝටීන් අඩංගු විය යුතුය. වර්ධනයේ අනෙක් අවස්ථා සඳහා දෙන ආහාර මිශ්‍රණ වල 17% ප්‍රෝටීන් අඩංගු විය යුතුය. තාරා පැටවුන්ගේ රයිබෝෆ්ලේවින්, විටමින් ඒ නියැසින් මැන්ගනීස් ආදී පෝෂ්‍ය පදර්ථ වල අවශ්‍යතාවය කුකුළු පැටවුන්ට වඩා වැඩිය.

### තාරා රෝග

කුකුලන් හා සසඳන විට තාරාවුන්ට වැලදෙන රෝග ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් අඩුය. නමුත් බරපතල හානි ගෙන දෙන ඔවුන්ට විශේෂ වූ රෝග තිබේ.

(අ) තාරාවුන්ගේ අක්මා ප්‍රදහය (**Duck Viral Hepatitis**) : වයිරසයක් මගින් බෝවන, රෝගයකි. සති තුනක් දක්වා වයස් වූ, පැටවුන්ට බොහෝ විට මෙම රෝගය වැල දුන විට මුල් දවස් හය ඇතුළත වැඩි මරණ සංඛ්‍යාව සිදුවේ. මරණ ප්‍රතිශතය සියයට 80% සිට 90% දක්වා වේ. රෝග ලක්ෂණ වලට සමාන දුර්වලතාවය, මාංශපේෂ වල

(33 වන පිටුව බලන්න)

*   *   *   *   *

**(25 පිටුවෙන්)**

විශේෂයෙන්ම බෙල්ලේ මාංශ පේෂ පාලනය අඩුකම අයත්ය. වයිරසය ශරීර ගත කළ සතුන්ගේ ලේ වලින් ලබාගත් මස්තු මිලි ලීටර් 0.5 ඒ ක් එන්නත් කිරීම සාමාන්‍ය ප්‍රතිකාරයයි.

(ආ) බොටියුලිසම් නැතහොත් ලිම්බර්නෙක් (Botulism or limber neck) දිරායන කාබනික ද්‍රව්‍ය වල ඇතිවන විෂ සතුන්ගේ ශරීරගත වීම නිසා මෙම රෝගය වැළදේ රෝගය වැළඳුන සතුන් මරණයට මොහොතකට ප්‍රථම සම්පූර්ණයෙන්ම කොරවේ. මෙයට කරනු ලබන සාමාන්‍ය ප්‍රතිකාරයක් වන්නේ සහිඳ ලුණු වැනි විරේචකයක් වතුරේ දියකර දීමයි.

(ඇ) ක්විල් නැතහොත් පිහාටු ඉගිල්ලීම (Quill or Feather Fulling) : සතුන් ඉඩකඩ මදි කොටුවක ඇති කරන විට ඇතිවන නරක පුරුද්දකි. ආහාර මිශ්‍රණ යේ ප්‍රෝටීන් සහ ඛණිජ ලවන ඌණතාවය මෙම පුරුද්දට බලපායි.

(ඇ) ඇස්පර්ගිලෝසිස් (Aspergilloses) පුස් වර්ගයක් නිසා ඇතිවන රෝගයකි. විශේෂ යෙන්ම වයසින් බාල සතුන්ගේ මරණ යට ඇති කරයි. රෝගයේ මූලය වන්නේ බොහෝ විට පුස් හටගත් සන ආස්තරය හෝ පුස් සහිත ආහාරයයි. රෝගය වැළඳී කල්ග වූ විට සතුන් උදසීන බවත්, ස්වසනයේ අපහසු තාවයෙනුත් සහ.මස් දිරායාමේ ලක්ෂ ණත් පෙන්වයි. පෙනහැල්ලේ ගැටිති දැකිය හැක. කොටුවල සන ආස්තරය හොඳින් තබා ගැනීමෙන් හා අලුත් ආහාර පාවිච්චි කිරීමෙන් රෝගය වලක්වා ගත හැක.

## පැනවිසඳුම් තරගය

සංස්කාරකවරුන්ට පාලනය කරගත නොහැකිවූ හේතුවක් නිසා පැනවිසඳුම් තරගය මෙවර පළ නොවන අතර ලබන කලාපයේ සිට පළවන බව කරුණාවෙන් සලකන්න.